# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,391 - 2024 ජූනි මස 28 වැනි සිකුරාදා - 2024.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1724 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1731 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා අධිකරණ සේවයේ පුරප්පාඩු

### ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරී (මහෙස්ත්‍රාත්) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

01. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන **2024.07.19** දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අයදුම්කරුගේ ලිපිනය පැහැදිලි ව සඳහන් කරන ලද රු. 110 ක (විභාග අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීම සඳහා) වටිනාකමකින් යුතු මුද්දර ඇළ වූ ලියුම් කවරයක් ද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

02. *වැටුප් ක්‍රමය.*-රු. 75,000 - 10x1630-රු.91,300 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2018 අනුව). අධිකරණ නිලධාරීන්ට හිමි දීමනා වැටුපට අමතර ව ගෙවනු ලැබේ.

03. *සෑම අයදුම්කරුවෙක් ම -*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

04. *සුදුසුකම් :*

(*අ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු දෙකකට නොඅඩු සේවා කාලයක් ඇති කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරයෙකු වීම;

*හෝ*

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු හතරකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙ හි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයෙකු වීම;

*හෝ*

(*ඇ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් අමාත්‍යාංශයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් රජයේ ආයතනයක අවුරුදු හතරකට නොඅඩු කාලයක් නීති නිලධරයකු/නීති පර්යේෂණ නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයෙකු වීම ;

*හෝ*

(*ඈ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු හතරකට නොඅඩු කාලයක් සේවයකර ඇති සහ එම කාලය තුළ නිරතුරුව ම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයෙකු වීම.

*සැ. යු.* : ඉහත (ආ)., (ඇ) සහ (ඈ) යන ඡේදයන් හි සඳහන් කර ඇති ''අවුරුදු හතරකට නොඅඩු'' සේවා කාලය/ක්‍රියාකාරී වෘත්තීය කාලය ගණනය කිරීමේ දී, ඉහත (ආ), (ඇ), සහ (ඈ) හි සඳහන් සේවා කාලයන්/ක්‍රියාකාරී වෘත්තීය කාලයන් හි සංකලනයන් ද සලකා බැලේ.

05. සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්‍ෂණයකට/පරීක්ෂණවලට කැඳවනු ලැබේ.

සටහන :

01. අයදුම්පත් ගාස්තුව රු. 7,500 කි. එම මුදල මහජන බැංකුවේ, වෙල්ල විදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 297100199025039 දරන ''ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව'' යන ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් හෝ පෞද්ගලිකව පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් අයදුම්පත් ලබාගත හැක. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේ දී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

02. සිය අයදුම්පත ලබාගැනීම සහ සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරදීම ලියාපදිංචි තැපෑලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ සිදු කළ යුතු වේ.

03. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් ලබා ගැනීම සහ ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය :

ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාව,<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,<br>
කොළඹ 12.

එච්. සංජීව සෝමරත්න,<br>
ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2024 ජුනි මස 28 වැනි දින,<br>
කොළඹ 12,<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

06-195

## ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාව

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කෙටිකාලීන අධිකාරිය සහ ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම නිලධාරී/නිලධාරිනි පුරප්පාඩු - 2024

1. ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවේ කෙටිකාලීන අධිකාරිය සහ ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම නිලධාරීන්/ නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා දක්වා ඇති පරිදි පිරිමි/කාන්තා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

   අ. දන්ත වෛද්‍ය නිලධාරි (නිත්‍ය/ස්වේච්ඡා) - කෙටිකාලීන අධිකාරිය,
   ආ. ඉංග්‍රීසි භාෂා උපදේශක නිලධාරි (ස්වේච්ඡා).

3. මූලික අධ්‍යාපන සුදුසුකම්;

   අ. අ.පො.ස (සා/ පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයයන්වලට සම්මාන (C) සාමාර්ථයන් සමග ගණිතය විෂය ඇතුළත් ව විෂයයන් 06ක් සමත් ව තිබීම ;

   *හෝ*

   ආ. අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථයක් සමග ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුළත් ව විෂයයන් 06ක් සමත් වී තිබීම හා ඉංග්‍රීසි විෂය සම්බන්ධව ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

4. උසස් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් ;

   **අ. දන්ත වෛද්‍ය අංශය :**

   දන්ත වෛද්‍ය නිලධාරි (නිත්‍ය) කෙටි කාලීන අධිකාරිය/දන්ත වෛද්‍ය නිලධාරි (ස්වේච්ඡා)

   නිලය - වෛද්‍ය ලුතිනන් (පිරිමි/කාන්තා)

   අධ්‍යාපන සුදුසුකම් - දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය (BDS) හෝ ඊට සමාන සුදුසුකමක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම.

   වයස - අවුරුදු 35ට අඩු විය යුතුය.

   **ආ. ඉංග්‍රීසි භාෂා උපදේශක නිලධාරි (ස්වේච්ඡා) :**

   නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)

   අධ්‍යාපන සුදුසුකම් - පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 03ක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උපාධියක් සමග රජයේ හෝ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 03ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම;

   *හෝ*

   වෙනත් භාෂා කථිකයන් සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව කලා උපාධියක් ලබා තිබීම. (TESOL)

   *හෝ*

   ගුරු පුහුණු විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම සමග රජයේ හෝ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 03ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම.

   වයස - අවුරුදු 35ට අඩු විය යුතුය.

5. **අනෙකුත් සුදුසුකම් :**

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය;

| | | | | |
|---|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. | |
| ආ. | වයස | - | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට අඩු විය යුතුය. | |
| ඇ. | උස | - | පිරිමි | - අඟල් 66ට නොඅඩු විය යුතුය. |
| | | | කාන්තා | - අඟල් 63ට නොඅඩු විය යුතුය. |
| ඈ. | බර | - | පිරිමි | - කි.ග්‍රෑ. 52ට නොඅඩු විය යුතුය. |
| | | | කාන්තා | - කි.ග්‍රෑ. 41ට නොඅඩු විය යුතුය. |
| ඉ. | පපුව | - | (පිරිමි) අඟල් 32ට නොඅඩු විය යුතුය. | |
| ඊ. | වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II (නිසි පෙනුම). | |
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) [දන්ත වෛද්‍ය අංශය සඳහා 6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති පුද්ගලයන් සලකා බැලිය හැක.] | |
| ඌ. | සිවිල් තත්වය | - | විවාහක/අවිවාහක. | |

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ. තවද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ.

7. ඉහත සඳහන් 3, 4 සහ 5 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සේවා කොන්දේසි;

අ. අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරී/නිලධාරිනී තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරීන්/නිලධාරිනියන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. සියලුම නිලධාරීන්/නිලධාරිනියන් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළදී හා ඉන්පසුව නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා පනත, නාවික හමුදා රෙගුලාසි, නාවික හමුදා නියෝග හා සංදේශ මගින් බලාත්මක කරනු ලබන නීති රීති හා උපදෙස් සහ මින් මතුවට පනවනු ලබන නීතිරීති හා උපදෙස්වලටද යටත් විය යුතුයි.

ඉ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ නිලධාරියා/නිලධාරිනිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

ඊ. අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් නිලධාරියෙකු/නිලධාරිනියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

9. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා;

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

10. වැටුප් හා දීමනා;

දන්ත වෛද්‍ය නිලධාරි අංශය සඳහා :

2024.01.10 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2024 අනුව වේ.

| *විස්තරය* | *ශ්‍රේණිය* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|
| මූලික වැටුප | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 52,955.00 | 52,955.00 | 52,955.00 |
| ජීවන වියදම් දීමනාව | - | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | - | 525.00 | 525.00 | 525.00 |
| අතුරු දීමනාව | - | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | - | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අතුරු දීමනාව - 2022 | - | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| ආහාර දීමනාව | - | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 70,000.00 | 70,000.00 | 70,000.00 |
| විශ්‍රාම වැටුප් සහිත දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,700.00 | 1,700.00 | 1,700.00 |
| විශ්‍රාම වැටුප් රහිත දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,700.00 | 1,700.00 | 1,700.00 |
| විශේෂ අමතර දීමනාව (දන්ත වෛද්‍ය නිලධාරි) | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,500.00 | 1,500.00 | 1,500.00 |
| | එකතුව | 190,026.80 | 190,026.80 | 190,026.80 |

ඉංග්‍රීසි භාෂා උපදේශක නිලධාරි අංශය සඳහා :

2024.01.10 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2024 අනුව වේ.

| *විස්තරය* | *වැඩබලන උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|
| මූලික වැටුප | 41,905.00 | 47,615.00 | 55,625.00 | 60,965.00 |
| ජීවන වියදම් දීමනාව | 17,800.00 | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | 525.00 | 525.00 | 525.00 | 525.00 |
| දුෂ්කර ලැගුම් දීමනාව | 600.00 | 600.00 | 600.00 | 600.00 |

| *විස්තරය* | *වැඩබලන උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අතුරු දීමනාව -2022 | 5,000.00 | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| ආහාර දීමනාව | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| එකතුව | 104,676.80 | 110,386.80 | 118,396.80 | 123,736.80 |

11. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමිවන පහසුකම්, දීමනා හා වරප්‍රසාද :

අ. පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරීන්/නිලධාරිනියන් හට නිලධාරි නිවාස තුළින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

ආ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඇ. කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට/නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරි නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඈ. නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

ඉ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට)

ඊ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට/නිලධාරිනියන්ට රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

උ. ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරීන්/නිලධාරිනියන් සඳහා පමණක් හිමි වේ.

ඌ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.

එ. විවාහක නිලධාරීන්/නිලධාරියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

12. අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස් :

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙ හි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිත ව පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. **ඉල්ලුම්පත් 2024 ජූලි මස 24 වැනි දින දහවල් 12.00ට** ප්‍රථම ලැබෙන සේ 'ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවාගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ 01' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'ඉඳුරාම බඳවා ගැනීම 2024/02 - නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරීන්/නිලධාරිනියන්' යනුවෙන් සටහන් කළ යුතුයි. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකි අතර, වැඩි විස්තර දුරකතන අංක 011-7195120/ 011-7195154 මගින් ලබාගත හැක.

ආ. ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව දැනුම් දීමක් සිදු කරනු නොලැබේ. තැපැලේ දී යම් අයදුම්පත්‍රයක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බවට දැනුම් දීමක් සිදු කරනු නොලැබේ.

ඇ. රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි) නියුතු අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතුය.

ඈ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම්කර ඇති අංශයට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇතිබව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/උපාධි /පශ්චාත් උපාධි සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(6) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතුය);
(7) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඉ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඊ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය. එසේ සිය අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික අස්ථානගත වුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. ඉල්ලුම්පතෙ හි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/ අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිත ව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

14. බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ඃ

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ / අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ. මූලික සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා ඃ

| ස්ත්‍රී/පුරුෂ භාවය | PUSH UPS (මිනිත්තු 1ක් තුළ) | CURL UPS (මිනිත්තු 1ක් තුළ) | මීටර 1600 දුර දිවීම (මිනිත්තු) |
|---|---|---|---|
| පුරුෂ | 12 | 10 | 09 |
| ස්ත්‍රී | 08 | 07 | 11 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් නාවික හමුදා රෝහල මගින් සිදුකරන සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණය සඳහා යොමු කරන අතර, වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබයි. එම පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවාගනු ලැබේ.

ඇ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඉ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය Whatsapp පණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඊ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත, ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

උ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද, එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේ ය.

ඌ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

15. ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉඳුරාම නිලධාරීන්/නිලධාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතු වන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතුවේ.

***සටහන*** - මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවේ. දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

යූවීඑම්පී පෙරේරා, ආර්එස්පී**, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවට ඉඳුරාම බඳවා ගන්නා නිලධාරීන්/නිලධාරිනියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන තනතුර :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. විද්‍යුත් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. වයස ؛ අවුරුදු :————. මාස :————. දින :————. (2024...... මස ..... වැනි දිනට )

10. උස :————. (අඟල්), පපුව :————. (අඟල්), බර :————. (කි.ග්‍රෑ.)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

15. දුරකථන (Whatsapp) අංකයඃ :————.

16. විවාහක/ අවිවාහක බව :————.

17. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් :————.

19. පාසල සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ඃ

| *පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. දෙමව්පියන් පිළිබඳ විස්තර ඃ

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :........................................................................
..........................................................................................................

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) : ....................................................................................................................................................................................................................................................

24. පාසලේ/ විශ්වවිද්‍යාලයේ/ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) : ......................................................................................................................................................................................................................................................................

25. සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බල සේනාවේ/ ශිෂ්‍යභට බළකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය : ..................................................................................................................................

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :......................................................................................................................................................................................................................

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න : ...........................................................................................................................................................................

28. රාජ්‍ය අංශයෙහි දෙපාර්තමේන්තුවක/ මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර/ සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :

......................................................................................................................................................................................................................................

29. *චරිත සහතික පිළිබඳ විස්තර* :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

30. ***අයදුම්කරු/ අයදුම්කාරිනිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය***

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාපිළිවෙළ හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරිනියගේ අත්සන.

දිනය :————.

06-209

2024.06.20 දින පළ වූ අංක 2390 ගැසට් පත්‍රයේ 06-181 නිවේදනය නැවත පළ කිරීමකි.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**බදුල්ල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 ජූලි මස 29** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 මැයි මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | ලුණුගල | ඔයපළාත නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ හා වියළුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

06-181

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රත්මලාන, දක්ෂිණ මණ්ඩපය සූරියවැව සහ මෙට්‍රොපොලිටන් මණ්ඩපය කොළඹ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/ නිලධාරිනි තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් 2024.06.28 සිට 2024.07.19 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා හා අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත් වන කෙඩෙට් නිලධාරි/ නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. • මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු වලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන පරිශ්‍රයෙහිදී පහත පාඨමාලාවන් පැවැත්වේ:

| | උපාධිය | අධ්‍යයන කාලය (වර්ෂ) |
|---|---|---|
| i. | විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය | 03 |
| ii. | වෛද්‍යවේදී සහ ශල්‍යවෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය | 05 |
| iii. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ගුවන්යානා ඉංජිනේරු උපාධිය | 04 |
| iv. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ජෛව වෛද්‍ය ඉංජිනේරු උපාධිය | 04 |
| v. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ගොඩනැගිලි සේවා ඉංජිනේරු උපාධිය | 04 |
| vi. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) සිවිල් ඉංජිනේරු උපාධිය | 04 |
| vii. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු උපාධිය | 04 |
| viii. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු උපාධිය | 04 |
| ix. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය | 04 |
| x. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) මෙකාට්‍රොනික් ඉංජිනේරු උපාධිය | 04 |
| xi. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) නාවික වාස්තුවිද්‍යා හා නාවික ඉංජිනේරු උපාධිය | 04 |
| xii. | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) නාවික ඉංජිනේරු උපාධිය | 04 |
| xiii. | නීතිවේදී උපාධිය | 04 |
| xiv. | විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය | 04 |
| xv. | විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු උපාධිය | 04 |
| xvi. | විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු උපාධිය | 04 |
| xvii. | විද්‍යාවේදී (ගෞරව) දත්ත විද්‍යාව හා ව්‍යාපාර විශ්ලේෂණ උපාධිය | 04 |
| xviii. | විද්‍යාවේදී ඉංජිනේරු තාක්‍ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්‍ෂණ උපාධිය | 04 |
| xix. | විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ උපාධිය | 03 |
| xx. | විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය | 03 |
| xxi. | විද්‍යාවේදී සමාජ විද්‍යා උපාධිය | 03 |
| xxii. | වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL) | 03 |
| xxiii. | විද්‍යාවේදී පොලිස් විද්‍යා උපාධිය | 03 |
| xxiv. | විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය | 03 |

• මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු වලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - සූරියවැව දක්ෂිණ මණ්ඩප පරිශ්‍රය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

| | | |
|---|---|---|
| xxv. | වාස්තුවිද්‍යාවේදී (ගෞරව) උපාධිය | 05 |
| xxvi. | විද්‍යාවේදී (ගෞරව) ප්‍රමාණ සමීක්‍ෂණ උපාධිය | 04 |
| xxvii. | විද්‍යාවේදී (ගෞරව) කාර්මික සහ සේවා තත්ත්ව කළමනාකරණ උපාධිය | 04 |
| xxviii. | විද්‍යාවේදී (ගෞරව) මැනුම් විද්‍යා උපාධිය | 04 |
| xxix. | විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ උපාධිය | 04 |
| xxx. | විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති උපාධිය | 04 |
| xxxi. | විද්‍යාවේදී (ගෞරව) භූ තොරතුරු උපාධිය | 04 |

● මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරු වලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - මෙට්‍රොපොලිටන් මණ්ඩපය කොළඹ පරිශ්‍රය තුළ පහත පාඨමාලාව පැවැත්වේ.

| | උපාධිය | අධ්‍යයන කාලය (වර්ෂ) |
|---|---|---|
| xxxii. | තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය | 04 |

● ඉහත උපාධි පාඨමාලාවන් සඳහා තෝරා ගන්නා ලද කෙඩෙට් නිලධාරි/නිලධාරිනියන් උපාධි පාඨමාලාව ආරම්භ වීමට පෙර උපරිමය මාස හයකට යටත්ව අනිවාර්ය මූලික හමුදා පුහුණුවකට අනුයුක්ත කරනු ලැබේ.

3. 1 උපාධි පාඨමාලාවන් සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවලදී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව හා එක් එක් හමුදාවට අවශ්‍ය ශාරීරික හා වෙනත් යෝග්‍යතා පදනම් කොට ගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරිලත් තනතුරු සඳහා පත්කරනු ලැබේ.

3. 2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට පහත උපාධි පිරිනැමේ.

- විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය
- වෛද්‍යාවේදී සහ ශල්‍යවෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ගුවන්යානා ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ජෛව වෛද්‍ය ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ගොඩනැගිලි සේවා ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) සිවිල් ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) මෙකාට්‍රොනික් ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) නාවික වාස්තුවිද්‍යා හා නාවික ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) නාවික ඉංජිනේරු උපාධිය
- නීතිවේදී උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) දත්ත විද්‍යාව හා ව්‍යාපාර විශ්ලේෂණ උපාධිය
- විද්‍යාවේදී ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්ෂණය උපාධිය
- විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ උපාධිය
- විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය
- විද්‍යාවේදී සමාජ විද්‍යා උපාධිය
- වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL)
- විද්‍යාවේදී පොලිස් විද්‍යා උපාධිය
- විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය
- වාස්තුවිද්‍යාවේදී (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) ප්‍රමාණ සමීක්ෂණ උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) කාර්මික හා සේවා තත්ත්ව කළමනාකරණ උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) මැනුම් විද්‍යා උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති උපාධිය
- විද්‍යාවේදී (ගෞරව) භූ තොරතුරු උපාධිය
- තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය

3. 3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3. 4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය.

(i) **විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ : 3) - (ගැහැණු/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ ඕනෑම විෂය ධාරාවක් හදාරා උපරිම වාර 3 ක දී අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(ii) **වෛද්‍යවේදී සහ ශල්‍යවෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ පහයි. (වර්ෂ: 5) - (කාන්තා/පිරිමි)**

2023 (2024) වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථය (C) දෙකක් හා සාමාන්‍ය සාමාර්ථය (S) එකක් (01) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථය දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2024 වර්ෂයේ කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

**සැ. යු :** කෙසේ වුව ද වයස අවුරුදු 17ට අඩු අයෙකු (2023) වර්ෂයේ දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනී සිට සුදුසුකම් ලබා තිබුණහොත් එම ප්‍රතිඵල සලකා බලනු ලැබේ.

(iii) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ගුවන්යානා ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථය (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(iv) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ජෛව වෛද්‍ය ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(v) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) ගොඩනැගිලි සේවා ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ

(S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L)

විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(vi) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) සිවිල් ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථය (S) එකක් සහිතව ගණිතය විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථය එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(vii) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථය (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(viii) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(ix) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) යාන්ත්‍රික ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(x) විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) මෙකාට්‍රොනික් ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(xi) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) නාවික වාස්තුවිද්‍යා හා නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ:4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථය (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(xii) **විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව (වර්ෂ : 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් "B" සාමාර්ථ දෙකක් (02) හා "C" සාමාර්ථ එකක් (01) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

(xiii) **නීතිවේදී උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ : 4) (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යා හෝ වාණිජ හෝ කලා හෝ විෂයය ධාරා යටතේ පහත සඳහන් විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ (S) එකක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලබා හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ පහත සඳහන් විෂයයන් හදාරා අවම වශයෙන් "C" සාමාර්ථ තුනක් (03) සහිතව 2024 හෝ 2023 වර්ෂවල දී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට හෝ උපරිම වාර 3 ක දී ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක සඳහන්ව තිබිය යුතුය.

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ වෙනත් විෂය ධාරාව යටතේ පහත සඳහන් විෂයයන් හදාරා ඇති සිසුන් ද නීතිවේදී උපාධිය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

පහත ලැයිස්තුවෙන් විෂයයන් තුනක්, දෙකක් හෝ අවම වශයෙන් එකක් හදාරා තිබිය යුතුය.

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| භෞතික විද්‍යාව | ගණිතය/ සංයුක්ත ගණිතය | නීතිය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | සමාජ විද්‍යාව | මනෝ විද්‍යාව |
| පරිගණක විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

සහ

පහත ලැයිස්තුවෙන් අනෙක් විෂය/ විෂයයන් හදාරා තිබිය යුතුය.

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය | දෙමළ | චීන |
| ශාස්ත්‍රීය අධ්‍යයනය | සංස්කෘත | අරාබි |
| හින්දු ධර්මය / හින්දු ශිෂ්ටාචාරය | ප්‍රංශ | පාලි |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සිංහල | ඉංග්‍රීසි (විෂය අංක 73) |
| ඉස්ලාම් / ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් | ස්පාඤ්ඤ |
| ගෝලීය දර්ශණය සහ පර්යේෂණ | ඉංග්‍රීසි සාහිත්‍ය | ජර්මන් |
| ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | රුසියානු භාෂාව | හින්දි භාෂාව |

⋆ ඊට අමතරව අපේක්ෂකයන් අ.පො.ස. (සා/පෙළ.) විභාගයේ දී සිංහල/දෙමළ විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

⋆ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ තෝරාගනු ලබන සිසුන් බඳවාගත් දින සිට වසර දෙකක් (02) ඇතුළත අ.පො.ස (සා/පෙළ) විභාගයේ සිංහල/දෙමළ භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබාගත යුතුය.

(xiv) **විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සමග භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xv) **විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සමග භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xvi) **විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සමග භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xvii) **විද්‍යාවේදී (ගෞරව) දත්ත විද්‍යාව හා ව්‍යාපාර විශ්ලේෂණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සමග භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන් දෙක සමග රසායන විද්‍යාව, උසස් ගණිතය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xviii) **විද්‍යාවේදී ඉංජිනේරු තාක්‍ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්‍ෂණය උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව (ඉංජිනේරු තාක්‍ෂණය, තාක්‍ෂණය සඳහා විද්‍යාව සහ වෙනත් එක් විෂයයක්) හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ භෞතීය විද්‍යා විෂය ධාරාව (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව (ඉංජිනේරු තාක්‍ෂණය, තාක්‍ෂණය සඳහා විද්‍යාව සහ වෙනත් එක් විෂයයක්) හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය "D" තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xix) **විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3). - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා, භෞතීය විද්‍යාව හෝ වාණිජ විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ ජීව විද්‍යා, භෞතීය විද්‍යාව හෝ වාණිජ විෂය ධාරාව හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xx) **විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ : 3) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යාව විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 ක දී ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යාව විෂය ධාරාව හදාරා අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xxi) **විද්‍යාවේදී සමාජ විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3) - (කාන්තා/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ ඕනෑම විෂය ධාරාවක් හදාරා උපරිම වාර 3 ක දී අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/

Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xxii) **වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (TESOL) : කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ: 3) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ ඕනෑම විෂය ධාරාවක් හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම "B" සාමාර්ථයක් තිබිය යුතුය.

කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම "B" සාමාර්ථයක් ලබා තිබීම.

(xxiii) **විද්‍යාවේදී පොලිස් විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ: 3) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වසර වල අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ හෝ කලා විෂයය ධාරාව යටතේ පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් තුනකට (03) අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත සඳහන් A ලැයිස්තුවෙන් විෂයන් තුනක් හෝ ලැයිස්තුවෙන් විෂයන් දෙකක් හා B ලැයිස්තුවෙන් එක් විෂයක් සහිතව සමත් වී තිබිය යුතුය.

| A ලැයිස්තුව | B ලැයිස්තුව |
|---|---|
| ගිණුම්කරණය | බුද්ධාගම |
| භූගෝල විද්‍යාව | බෞද්ධ ශිෂ්ඨාචාරය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ක්‍රිස්තියානි ආගම / ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය |
| භෞතික විද්‍යාව | ජපන් භාෂාව |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ඉංග්‍රීසි (විෂය අංක 73) |
| දේශපාලන විද්‍යාව | සංස්කෘත භාෂාව |
| ජීව විද්‍යාව | හින්දු ආගම/හින්දු ශිෂ්ඨාචාරය |
| ඉතිහාසය | කෘෂි තාක්ෂණය |
| රසායන විද්‍යාව | ඉස්ලාම් ආගම / ඉස්ලාම් ශිෂ්ඨාචාරය |
| ගණිතය/ සංයුක්ත ගණිතය | චීන භාෂාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පාලි භාෂාව |
| කෘෂි විද්‍යාව | ජර්මන් භාෂාව |
| නීතිය | දෙමළ භාෂාව |
| උසස් ගණිතය | සිංහල භාෂාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ප්‍රංශ භාෂාව |
| ආර්ථික විද්‍යාව | අරාබි භාෂාව |
| | රුසියානු භාෂාව |

මීට අමතරව අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම.

(xxiv) **විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධි පාඨමාලාව :කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ:3) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වසර වල අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ හෝ කලා විෂයය ධාරාව යටතේ පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 ක දී පහත සඳහන් විෂයයන් තුනකට (03) අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත සඳහන් A ලැයිස්තුවෙන් විෂයන් තුනක් හෝ B ලැයිස්තුවෙන් විෂයන් දෙකක් හා ඊ ලැයිස්තුවෙන් එක් විෂයක් සහිත ව සමත් වී තිබිය යුතුය.

| A ලැයිස්තුව | B ලැයිස්තුව |
|---|---|
| ගිණුම්කරණය | බුද්ධාගම |
| භූගෝල විද්‍යාව | බෞද්ධ ශිෂ්ඨාචාරය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ක්‍රිස්තියානි ආගම / ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය |
| භෞතික විද්‍යාව | ජපන් භාෂාව |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ඉංග්‍රීසි (විෂය අංක 73) |
| දේශපාලන විද්‍යාව | සංස්කෘත භාෂාව |
| ජීව විද්‍යාව | හින්දු ආගම/හින්දු ශිෂ්ඨාචාරය |
| ඉතිහාසය | කෘෂි තාක්ෂණය |
| රසායන විද්‍යාව | ඉස්ලාම් ආගම / ඉස්ලාම් ශිෂ්ඨාචාරය |
| ගණිතය/ සංයුක්ත ගණිතය | චීන භාෂාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පාලි භාෂාව |
| කෘෂි විද්‍යාව | ජර්මන් භාෂාව |
| නීතිය | දෙමළ භාෂාව |
| උසස් ගණිතය | සිංහල භාෂාව |
| ව්‍යාපාර අධ්‍යයනය | ප්‍රංශ භාෂාව |
| ආර්ථික විද්‍යාව | අරාබි භාෂාව |
| | රුසියානු භාෂාව |

මීට අමතරව අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිම.

(xxv) **වාස්තුවිද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ පහයි. (වර්ෂ: 05) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී ජීව විද්‍යා , භෞතීය විද්‍යාව , වාණිජ හෝ කලා විෂයය ධාරාව යටතේ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

i. ජීව විද්‍යා , භෞතීය විද්‍යාව විෂය ධාරාව හදාරා අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක්

| | | |
|---|---|---|
| ජීව විද්‍යාව | රසායන විද්‍යාව | භූගෝල විද්‍යාව |
| උසස් ගණිතය | භෞතික විද්‍යාව | චිත්‍ර |
| සංයුක්ත ගණිතය | | |

සහ

ii. පහත ලැයිස්තුවෙන් උපරිම විෂයයන් දෙකක් හදාරා තිබිය යුතුය

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත භාෂාව |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් භාෂාව |
| ඉංග්‍රීසි (විෂය අංක 73) | අරාබි භාෂාව |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් භාෂාව |
| හින්දි භාෂාව | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි භාෂාව |
| ප්‍රංශ භාෂාව | දෙමළ භාෂාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |

සහ

iii. අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම හෝ කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ගණිතය විෂයයට “D” සාමාර්ථයක් ලබා තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබීම හෝ

කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයෙන් ගණිතය විෂයයට “D” සාමාර්ථයක් ලබා තිබීම

සහ

iv. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පවත්වන අවකාශ ඥානය පිළිබඳ ඇගයීම් පරීක්ෂණය සමත් විය යුතුය.

(xxvi) **විද්‍යාවේදී (ගෞරව) ප්‍රමාණ සමීක්ෂණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 04) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යාව විෂය ධාරාව හෝ වෙනත් විෂය ධාරාව යටතේ පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 ක දී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිත 2023 හෝ 2024 වර්ෂවල දී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයක් :

සංයුක්ත ගණිතය /උසස් ගණිතය

සහ

පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂය / විෂයන් හදාරා තිබිය යුතුය

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
ව්‍යාපාර අධ්‍යයනය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ඊට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරා තිබිය යුතුය.

ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් සහ විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්

හෝ

කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ගණිතය විෂයයට සහ විද්‍යාව විෂයයන්ට අවම වශයෙන් “D” සාමාර්ථ ලබා තිබීම

(xxvii) **විද්‍යාවේදී (ගෞරව) කාර්මික හා සේවා තත්ත්ව කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ 04) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ හෝ කලා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 ක දී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
ගණිතය
කෘෂි විද්‍යාව
ජීව විද්‍යාව
සංයුක්ත ගණිතය
උසස් ගණිතය
සිවිල් තාක්ෂණවේදය
යාන්ත්‍රික තාක්ෂණවේදය
විදුලිය ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය
ආහාර තාක්ෂණවේදය
කෘෂි තාක්ෂණවේදය
ජෛව සම්පත් තාක්ෂණය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ආර්ථික විද්‍යාව
භූගෝල විද්‍යාව
දේශපාලන විද්‍යාව
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
ඉන්දියානු ඉතිහාසය
යුරෝපීය ඉතිහාසය
නූතන ලෝක ඉතිහාසය
ගෘහ ආර්ථික විද්‍යාව
සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
ව්‍යාපාර සංඛ්‍යානය
ව්‍යාපාර අධ්‍යයනය
ගිණුම්කරණය
බුද්ධාගම
ජර්මන් භාෂාව
චීන භාෂාව
හින්දු ආගම
ක්‍රිස්තියානි ආගම
ඉස්ලාම් ආගම
බෞද්ධ ශිෂ්ටාචාරය
හින්දු ශිෂ්ටාචාරය
ඉස්ලාම් ශිෂ්ටාචාරය
ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
චිත්‍ර
නර්තනය (දේශීය)
නර්තනය (භරත)
පෙරදිග සංගීතය
කර්නාටක සංගීතය
බටහිර සංගීතය
නාට්‍ය හා රංග කලාව (සිංහල)
නාට්‍ය හා රංග කලාව (දෙමළ)
නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)
සිංහල භාෂාව
දෙමළ භාෂාව
ඉංග්‍රීසි භාෂාව
පාලි භාෂාව
සංස්කෘත භාෂාව
අරාබි භාෂාව
මැලේ භාෂාව
ප්‍රංශ භාෂාව
ජපන් භාෂාව
හින්දි භාෂාව
කොරියානු භාෂාව
රුසියානු භාෂාව
ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ඊට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී අවම වශයෙන් පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම

හෝ

කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ගණිතය විෂයයට "D" සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

(xxviii) විද්‍යාවේදී (ගෞරව) මැනුම් විද්‍යා උපාධි පාඨමාලාව: කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4)- (පිරිමි)

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් භෞතීය විද්‍යාව හෝ වෙනත් විෂය ධාරාව යටතේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් දෙක සමග පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් දෙක සමග පහත දැක්වෙන විෂයයන් අතුරින් එක් විෂයක් සඳහා අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

| | |
|---|---|
| රසායන විද්‍යාව | හින්දු ආගම |
| ගණිතය | ක්‍රිස්තියානි ආගම |
| උසස් ගණිතය | ඉස්ලාම් ආගම |
| සිවිල් තාක්‍ෂණවේදය | බෞද්ධ ශිෂ්ඨාචාරය |
| යාන්ත්‍රික තාක්‍ෂණවේදය | හින්දු ශිෂ්ඨාචාරය |
| විදුලිය ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්‍ෂණවේදය | ඉස්ලාම් ශිෂ්ඨාචාරය |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය | ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය |
| ආර්ථික විද්‍යාව | චිත්‍ර |
| භූගෝල විද්‍යාව | නර්තනය (දේශීය) |
| දේශපාලන විද්‍යාව | නර්තනය (භරත) |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | පෙරදිග සංගීතය |
| ඉන්දියානු ඉතිහාසය | කර්නාටක සංගීතය |
| යුරෝපීය ඉතිහාසය | බටහිර සංගීතය |
| නූතන ලෝක ඉතිහාසය | නාට්‍ය හා රංග කලාව (සිංහල) |
| ගෘහ ආර්ථික විද්‍යාව | නාට්‍ය හා රංග කලාව (දෙමළ) |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) |
| ව්‍යාපාර සංඛ්‍යානය | සිංහල භාෂාව |
| ව්‍යාපාර අධ්‍යයනය | දෙමළ භාෂාව |
| ගිණුම්කරණය | ඉංග්‍රීසි භාෂාව |
| බුද්ධාගම | පාලි භාෂාව |
| ජර්මන් භාෂාව | සංස්කෘත භාෂාව |
| ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය | අරාබි භාෂාව |
| ජපන් භාෂාව | මැලේ භාෂාව |
| රුසියානු භාෂාව | ප්‍රංශ භාෂාව |
| කොරියානු භාෂාව | හින්දි භාෂාව |
| චීන භාෂාව | |

(xxix) **විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව: කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4)- (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා, භෞතීය විද්‍යාව වාණිජ හෝ කලා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 ක දී ජීව විද්‍යා, ගණිත, වාණිජ හෝ කලා විෂය ධාරාවන් යටතේ අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ

2024 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

උසස් පෙළ වාණිජ විෂය ධාරාව හදාරා ඇති සිසුන් පහත සඳහන් A ලැයිස්තුවෙ හි සඳහන් විෂයන් තුනම හෝ දෙකක් සහ B ලැයිස්තුවෙහි සඳහන් එක් විෂයක් ද හදාරා තිබිය යුතුය.

*ලැයිස්තුව A* :
ගිණුම්කරණය
ව්‍යාපාර අධ්‍යයනය
ආර්ථික විද්‍යාව

*ලැයිස්තුව B* :
ව්‍යාපාර සංඛ්‍යානය
භූගෝල විද්‍යාව
දේශපාලන විද්‍යාව
ඉන්දීය ඉතිහාසය
යුරෝපීය ඉතිහාසය
නූතන ලෝක ඉතිහාසය
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
ඉංග්‍රීසි භාෂාව
ජර්මන් භාෂාව
ප්‍රංශ භාෂාව
කෘෂි විද්‍යාව
සංයුක්ත ගණිතය/ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණවේදය
භෞතික විද්‍යාව

උසස් පෙළ කලා විෂය ධාරාව යටතේ ඇති ඕනෑම විෂයක් හදාරා ඇති සිසුන්ට අයදුම් කළ හැකිය.

(xxx) **විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති උපාධි පාඨමාලාව: කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4)- (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ හෝ කලා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ හෝ කලා විෂය ධාරාවන් යටතේ අවම වශයෙන් "D" සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

උසස් පෙළ වාණිජ විෂය ධාරාව හදාරා ඇති සිසුන් පහත සඳහන් A ලැයිස්තුවෙහි සඳහන් විෂයන් තුනම හෝ දෙකක් ද, B ලැයිස්තුවෙහි සඳහන් එක් විෂයක් ද හදාරා තිබිය යුතුය.

*ලැයිස්තුව A* :
ගිණුම්කරණය
ව්‍යාපාර අධ්‍යයනය
ආර්ථික විද්‍යාව

*ලැයිස්තුව B* :
ව්‍යාපාර සංඛ්‍යානය
භූගෝල විද්‍යාව
දේශපාලන විද්‍යාව
ඉන්දීය ඉතිහාසය
යුරෝපීය ඉතිහාසය

නූතන ලෝක ඉතිහාසය
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
ඉංග්‍රීසි භාෂාව
ජර්මන් භාෂාව
ප්‍රංශ භාෂාව
කෘෂි විද්‍යාව
සංයුක්ත ගණිතය/ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය
භෞතික විද්‍යාව

උසස් පෙළ කලා විෂය ධාරාව යටතේ ඇති ඕනෑම විෂයක් හදාරා ඇති සිසුන්ට අයදුම් කළ හැකිය.

**(xxxi) විද්‍යාවේදී (ගෞරව) භූ තොරතුරු උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (ගැහැණු/පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ, කලා, තාක්ෂණවේදය හෝ වෙනත් (පහත සඳහන් පොදු විෂයයන්) විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී ඕනෑම විෂය ධාරාවක් (ජීව විද්‍යා, භෞතීය විද්‍යාව, වාණිජ, කලා, තාක්ෂණවේදය හෝ වෙනත් (පහත සඳහන් පොදු විෂයයන්) විෂය ධාරාව හදාරා අවම වශයෙන් “D” සාමාර්ථ තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂවලදී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
ගණිතය
කෘෂි විද්‍යාව
ජීව විද්‍යාව
සංයුක්ත ගණිතය
උසස් ගණිතය
සිවිල් තාක්ෂණවේදය
යාන්ත්‍රික තාක්ෂණවේදය
විදුලිය ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය
ආහාර තාක්ෂණවේදය
කෘෂි තාක්ෂණවේදය
ජෛව සම්පත් තාක්ෂණය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ආර්ථික විද්‍යාව
භූගෝල විද්‍යාව
දේශපාලන විද්‍යාව
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
ඉන්දියානු ඉතිහාසය
යුරෝපීය ඉතිහාසය
නූතන ලෝක ඉතිහාසය
ගෘහ ආර්ථික විද්‍යාව
සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
ව්‍යාපාර සංඛ්‍යානය
ව්‍යාපාර අධ්‍යයනය
ගිණුම්කරණය
බුද්ධාගම
ජර්මන් භාෂාව
චීන භාෂාව
ඉංජිනේරු තාක්ෂණවේදය
විද්‍යාව සඳහා තාක්ෂණවේදය
හින්දු ආගම
ක්‍රිස්තියානි ආගම
ඉස්ලාම් ආගම
බෞද්ධ ශිෂ්ටාචාරය
හින්දු ශිෂ්ටාචාරය
ඉස්ලාම් ශිෂ්ටාචාරය
ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
චිත්‍ර
නර්තනය (දේශීය)
නර්තනය (භරත)
පෙරදිග සංගීතය
කර්නාටක සංගීතය
බටහිර සංගීතය
නාට්‍ය හා රංග කලාව (සිංහල)
නාට්‍ය හා රංග කලාව (දෙමළ)
නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි)
සිංහල භාෂාව
දෙමළ භාෂාව
ඉංග්‍රීසි භාෂාව
පාලි භාෂාව
සංස්කෘත භාෂාව
අරාබි භාෂාව
මැලේ භාෂාව
ප්‍රංශ භාෂාව
ජපන් භාෂාව
හින්දි භාෂාව
කොරියානු භාෂාව
රුසියානු භාෂාව
ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
ජෛව පද්ධති තාක්ෂණවේදය

ඊට අමතරව, අපේක්ෂකයන් අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරා තිබිය යුතුය.

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම ;

හෝ

කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ගණිතය විෂයයට "D" සාමාර්ථ යක් ලබා තිබීම.

(xxxii) **තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධි පාඨමාලාවඃ කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂඃ 4) - (පිරිමි)**

2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් සහිතව භෞතීය විද්‍යාව විෂය ධාරාව (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය), ජීව විද්‍යා විෂය ධාරාව (ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව) හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව (ඕනෑම විෂයන් තුනක්) හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 ක දී භෞතීය විද්‍යාව විෂය ධාරාව (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය), ජීව විද්‍යා විෂය ධාරාව (ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව) හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව (ඕනෑම විෂයන් තුනක් ) හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ "D" තුනක් (03) සහිතව 2023 හෝ 2024 වර්ෂ වලදී කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

3. 5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/ නිලධාරිනියන් එම පාඨමාලාවට අදාල පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාල වන පරිදි ඉංග්‍රීසි, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, අන්තර් ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන්ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3. 6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳවද පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතුය.

04. අ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනී තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම්

අයදුම්කරු ඃ

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු වේ.

ii. 2024.07.19 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතු වේ.

iii. අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරික්ෂණයෙන් සමත් වී තිබීම (අවම ලකුණු - 30).

iv. අ.පො.ස (උ/පෙළ) අපේක්ෂකයෙකු නම් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලැබූවකු විය යුතු වේ.

v. අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/ නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

ආ. අධ්‍යාපන සුදුසුකම් ඃ-

(i) 2022 (2023) හෝ 2023 (2024) වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිටි (වෛද්‍යවේදී සහ ශල්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය හැර) සහ 2023 සහ 2024 වර්ෂයේ දී කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති අයදුම්කරුවන්ටද අයදුම් කල හැකිය.

(ii) සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ (Cambridge / Edexcel General Certificate of Secondary Education (GCSE) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට “C” සාමාර්ථයක් ලබා තිබීම අනිවාර්ය වේ. වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL) සඳහා පමණක් අ.පො.ස (සා/පෙළ) හෝ කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම “B” සාමාර්ථයක් තිබිය යුතුය.

(iii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත සුදුසුකම් ලැබීමට පහත නිර්ණායකයන්ද සපුරා තිබිය යුතුය. සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි, විද්‍යාව සහ ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ්‍ය (C) සහිතව සම්මාන සාමාර්ථ්‍ය (C) 06 ක් සමග අ.පො.ස (සා/පෙළ) සමත් විය යුතුය (අතිරේක විෂයයන් සලකා බලනු නොලැබේ). සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතුය.

(iv) ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත සුදුසුකම් ලැබීමට පහත නිර්ණායකයන්ද සපුරා තිබිය යුතුය. සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් මව් භාෂාව, ඉංග්‍රීසි, ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ්‍ය (C) සහිතව අපොස සාමාන්‍ය පෙළ සමත් විය යුතුය (අතිරේක විෂයයන් සලකා බලනු නොලැබේ).

(v) විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ කේම්බ්‍රිජ් / එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂා විෂයට සම්මාන සාමාර්ථ (C) ලබා තිබිය යුතුය (තෝරාගත් උපාධි පාඨමාලා සඳහා පමණක් අදාළ වේ).

විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවෙකු, අයදුම් කරන මොහොතේ දී ඉහත සුදුසුකම සපුරා නොමැති නම් ඔහුව/ඇයව කෙඩෙට් නිලධාරියෙකු ලෙස බඳවාගත් දින සිට වසර දෙකක් ඇතුලත අ.පො.ස. (සා/පෙ) විභාගයට පෙනීසිට සිංහල/දෙමළ භාෂාව විෂයට සම්මාන සාමාර්ථයක් (C) ලබාගත යුතුයි.

ඉහත සුදුසුකම නියමිත වසර දෙක තුල දී සපුරනු නොලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් අදාළ සේවයෙන් ඉවත් කරනු ලැබේ

**ඈ. පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතුය.**

| | | යුධ | | නාවික | | ගුවන් | |
|---|---|---|---|---|---|---|---|
| | | *පුරුෂ* | *ස්ත්‍රී* | *පුරුෂ* | *ස්ත්‍රී* | *පුරුෂ* | *ස්ත්‍රී* |
| උස | වෛද්‍ය | 5' 6" | 5' 3" | සෙ.මී. 168 | සෙ.මී. 160 | 5' 5" සෙ.මී. 165 | 5' 3" සෙ.මී. 160 |
| | වෙනත් උපාධි පාඨමාලා | 5' 6" | 5' 3" | සෙ.මී. 168 (සෙ.මී. 171 Provost Branch) | සෙ.මී. 160 (සෙ.මී. 163 Provost Branch) | 5' 6" (සෙ.මී. 167.5) | 5' 4" (සෙ.මී. 162.5) |
| බර | | කි.ග්‍රෑ. 50 | - | කි.ග්‍රෑ. 52 | කි.ග්‍රෑ. 41 | - | - |
| ශරීර ස්කන්ධ දර්ශකය | | - | - | <22 සහ >17 | <27 සහ >17 | <26 සහ >17 | <25 සහ >17 |
| පපුව | | 32" (ප්‍රාශ්වාස) | - | සෙ.මී. 81 | - | 32" (අවමය සෙ.මී. 81) | - |

<u>**පෙනීම**</u>

| | | යුද | | | නාවික | | | ගුවන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **L** | **R** | **CP** | **L** | **R** | **CV** | **L** | **R** | **CP** |
| වෘත්තීය කාණ්ඩය | උපැස් රහිත | 6/18 | 6/18 | CP 2 | 6/18 | 6/18 | 24/24 By Ishihara's plates | 6/18 | 6/18 | CP 2 |
| | නිවැරදි කරන ලද දෘෂ්ටිය | 6/6 | 6/6 | CP 2 | - | - | - | 6/6 | 6/6 | CP 2 |
| | උපැස් සහිත | - | - | - | 6/6 | 6/6 | 24/24 By Ishihara's plates | - | - | - |
| | ආසන්න දෘෂ්ටිය | - | - | - | J – 01 (සිංහල) N - 08 (ඉංග්‍රීසි) | | | - | - | - |
| වෙනත් කාණ්ඩ | උපැස් රහිත | 6/9 | 6/6 | CP 2 | 6/6 | 6/6 | CP 2 | 6/6 | 6/6 | CP 2 |

★ යම් අයදුම්කරුවෙකු දෘෂ්ටිය නිවැරදි කරගැනීම සඳහා සිදුකරනු ලැබූ ශල්‍යකර්මයක් හෝ වැඩිදියුණු කරගැනීමේ ක්‍රියා පටිපාටියක් සිදුකල අවසාන දින සිට අයදුම්පත් බාරගන්නා අවසන් දින වනවිට මාස හයක (06) කාලයක් සම්පූර්ණ වී තිබිය යුතුය.

ඈ. **වෘත්තීය කාණ්ඩය යටතේ ඇති උපාධි පාඨමාලා :**

| සේවය | උපාධිය |
|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාව | වෛද්‍ය, ඉංජිනේරු (ගෞරව) |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | වෛද්‍ය |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | වෛද්‍ය |

වෙනත් කාණ්ඩ යටතේ ඇති උපාධි

★ ඉහත වගුවෙහි සඳහන් නොවෙන අනිත් සියලුම උපාධි.

**සටහන :-** යම් අයදුම්කරුවෙකු ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතා හෝ වර්ණ ලබා ඇත්නම් හෝ ජනාධිපති/අගමැති බාලදක්ෂයෙකු/දක්ෂිකාවක නම් හෝ පාසැල් ශිෂ්‍යභට බන්ධයේ යටත් නිලධාරියෙකු (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ) නම් හෝ ශිෂ්‍යභට සැරයන් හෝ ඉන් ඉහල තනතුරක් දරා ඇත්නම් ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන අවසාන සම්මුඛ පරීක්ෂණ තේරීම් කමිටුව විසින් ලිහිල් කිරීමට අවකාශය ඇත.

මෙහි දී ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතාවයන් යනු යම් අයදුම්කරුවෙකු වයස අවුරුදු 17න් පහල /19 න් පහල කාණ්ඩයේ පහත කුසලතා ලබා තිබීම වේ.

කේවල තරඟ - 1 වන/ 2 වන/ 3 වන ස්ථාන
කණ්ඩායම් තරඟ - ශූරතාව / ප්‍රථම අනුශූරතාව

★ යම් අයදුම්කරුවෙකු අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී 1.800 හෝ ඊට වැඩි Z අගයක් ලබා ඇත්නම් එවන් අයදුම්කරුවෙකු වෛද්‍ය උපාධි පාඨමාලාව හා ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා ඉල්ලුම් කරනවිට (ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා පමණයි) අයදුම්කරුගේ/කාරියගේ උස පිරිමි අයදුම් කරුවන් සඳහා 5’ 4” හා කාන්තා අයදුම් කාරියන් සඳහා 5’ 2” ලෙස ලිහිල් කරනු ලැබේ.

ඉ. අයදුම්කරු මනා සෞඛ්‍යය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ. තවද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) ලබා ගත හැකිය.

5. සේවා කොන්දේසිː- තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන, සූරියවැව දක්ෂිණ මණ්ඩපය හෝ මෙට්‍රොපොලිටන් මණ්ඩපය කොළඹ සඳහා උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සහ එම පනතේ සංශෝධනයන්ටද අනුකූලව විශ්වවිද්‍යාලය මගින් කලින්කලට පනවන ලද්දාවූ නීති රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත. වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්වූ දින සිට අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 20 කට නොඅඩු සේවා කාලයක් සේවය කල යුතුය.

අනෙකුත් උපාධි පාඨමාලාවන් සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයන් නිත්‍ය සේවාවේ අධිකාරියට පත් වූ දින සිට අනිවාර්ය වසර 12කට නොඅඩු සේවා කාලයක් සේවය කල යුතුවේ.

තවද, උපාධි පාඨමාලාවන් හදාරන කාලය අතරතුරදී වෛද්‍ය හේතූන් මත හෝ වෙනත් ඕනෑම හේතුවක් මත උපාධි පාඨමාලාව හැරයන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හට කිසිම අයුරකින් උපාධිය ලබානොදීමට කටයුතු කරනු ඇත.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරිම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුලත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 80,000/- ක් (සලාක දීමනාද ඇතුලත්ව) පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද සපයනු ලැබේ ඃ

I. නවාතැන් පහසුකම්
II. නිල ඇඳුම්
III. අනුගාමික සේවාවන්
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්
V. වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්හි අධිකාරියට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළ වන පරිදි එම සේවාවන්හි බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. පහත සඳහන් මාසික දීමනාවන්ද ගෙවනු ලැබේ.

I. සුදුසුකම් දීමනා
II. ආහාර දීමනාව
III. ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිලධාරීන්ට පමණක්)
IV. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව

ආ. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ./ දීමනා ගෙවනු ලැබේ.

I. ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්
II. විවාහක නිලධාරීන් සඳහා ලබා දෙන සීමිත ගෙවල් කුලී දීමනාව
III. නිල ඇඳුම් දීමනා
IV. විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/ අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය

9. ශ්‍රී ලංකා යුධ, නාවික සහ ගුවන් හමුදා වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

අ. යුධ හමුදා/නාවික හමුදා/ ගුවන් හමුදා වැටුප් සංග්‍රහය

ආ. යුධ හමුදා/ නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා *ගැසට්* පත්‍රයේ පළකරනු ලබන වලංගු රෙගුලාසි

ඇ. ශ්‍රී ලංකා *ගැසට්* පත්‍රයේ පළ කරන වලංගු යුධ හමුදා/ නාවික හමුදා/ ගුවන් හමුදා සහ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

10. පුහුණුවීම් කාලය තුළදී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු විසින් නියම කරනු ලබන පුහුණුවීම් වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුවේ.

13. භාෂා අවශ්‍යතා - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තාවූද ඉදිරියේදී පනවනු ලැබිය හැකිවූද නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුවේ.

14. අනන්‍යතාවය ඔප්පු කිරීම :- අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. (I) අයදුම්පත් :- මේ සඳහා අයදුම් කළ හැකි වනුයේ මෙම විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය (www.kdu.ac.lk) ඔස්සේ විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම මගින් පමණි (අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි දක්වා ඇත). තැපැල් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

(11) මෙම විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කර එක් උපාධි පාඨමාලාවක් සඳහා නැවත නොගෙවනු ලබන රුපියල් දෙදහසක (රු:2000/=) මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස මාර්ගගත ක්‍රමයට (Online Payment) ගෙවිය යුතුය. එලෙස මාර්ගගත ක්‍රමයට ගෙවීමට අපොහොසත් වන අයදුම්කරුවන් **මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට එක් උපාධි පාඨමාලාවක් සඳහා රුපියල් දෙදහසක (රු:2000/=) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය" නමින් මහජන බැංකුවේ "රත්මලාන ශාඛාව" අංක "080-100110020111" ගිණුමට බැර කර අයදුම්පත් බාරගන්නා අවසන් දිනට පෙර විශ්වවිද්‍යාලය වෙත ලබාදිය යුතුය.**

16. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර අයදුම්පත් එවීමේදී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදු කරනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පමණක් මූලික සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

මෙලෙස ඔබ විසින් සම්පූර්ණකරනු ලබන විද්‍යුත් අයදුම්පත් 2024.07.19 වෙනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය ඔස්සේ යොමුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරියෙකු/ නිලධාරිනියක අයදුම්පත් ඉදිරිපත්කර, එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද තිබිය යුතුය.

18. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල

ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටිය යුතු වේ.

19. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින විශ්ව විද්‍යාලීය වෙබ් අඩවිය මගින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් නිලධාරි යෝග්‍යතා පරීක්ෂණයේ දී හෝ හමුදා පුහුණුව අතරතුර අයදුම්කරුවන් හට සිදුවන කිසිදු ආකාරයක ආබාධ තත්ත්වයක වගකීමක් නොගන්නා අතර කිසිදු අයදුම්කරුවෙකුට කිසිදු තත්ත්වයක දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හෝ ශ්‍රී ලංකා රජය කිසිදු වන්දියක් නොගෙවන අතර හෝ වගකීමක් නොගනී.

21. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබාදීමෙනි. **අපේක්ෂකයෙකු තෝරාගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ** *නැතහොත්* **බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.**

22. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

23. ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ
කළමනාකරණ මණ්ඩලයේ සභාපති.

06-215

---

**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ බුද්ධිමය දේපළ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2024

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පුරප්පාඩුව පවතින ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ බුද්ධිමය දේපළ නිලධාරි තනතුරු **08 ක්** සඳහා සුදුස්සන් බඳවා ගැනීම පිණිස පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අයදුම් කිරීමේ සුදුසුකම් :*

1. අයදුම්පත් කැඳවීමේ දිනට වයස අවුරුදු 21ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි පහත සඳහන් සුදුසුකම් සහිත උපාධිධාරීන්ට මේ සඳහා අයදුම් කළ හැක. :

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී/ නීතිවේදී හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබිය යුතු ය;

ii. ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම අමතර සුදුසුකම් ලෙස සැලකේ.

02. *විභාග කොන්දේසි :*

**2024 අගෝස්තු මාසයේ** දී ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ආශ්‍රිත නිලධාරන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුකූලව විභාග කොමසාරිස් ජනරාල් විසින් **කොළඹ** දී පමණක් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams / E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත්

කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2024 ජූලි මස 01 වැනි දින පෙ. ව. 9.00ට විවෘත වන අතර 2024 ජූලි මස 31 වැනි දින රාත්‍රී 9.00ට අවසන් වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

03. සේවා කොන්දේසි :-

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද 2022.12.14 දිනැති අංක 2310/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ විධිවිධානවලට හා එම බඳවා ගැනීමේ පටිපාටියට මින් මතු සිදු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත් ව, තෝරාගනු ලබන අයදුම්කරුවන් බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරී III ශ්‍රේණියේ බුද්ධිමය දේපළ නිලධාරී තනතුරට පත් කරනු ලැබේ.

I. පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

II. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුවේ. තව ද ඔවුන් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමටය/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත්කරනු ලබන දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් ව පත්කරනු ලැබේ. පත් කරනු ලබන නිලධාරීන් පරිවාස කාලය අවසානයේ දී තනතුරෙ හි ස්ථිර කිරීම සඳහා වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වියයුතු අතර, පරිවාස කාලය තුළ දී නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව හා ඊට අනුෂාංගික රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව සේවයට බැඳී වසර 03ක් තුළ ලබාගත යුතු ය.

V. පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද කාර්ය පටිපාටික රීතිවලට ද රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත්, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

VI. මෙම *ගැසට්* පත්‍රයේ I වැනි කොටසේ (II අ) වැනි ඡේදය ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කෙරේ.

04. වැටුප් පරිමාණය :-

2016.02.25 දිනැති රා. ප. ච. 03/2016 ට අනුව MN - 4 - 2016 හි රු. 31,490 - 10X445 - 11X660 - 10X730 - 5X750 - රු. 54,250 (මාසික) වැටුප් පරිමාණය මෙම තනතුරට හිමිය.

05. වයස් සීමාව :-

1. අයදුම්පත් කැඳවීමේ දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ට මේ සඳහා අයදුම් කළ හැක.

06. කායික සුදුසුකම් :

I. සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

යෝග්‍යතාව :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. 2022.12.14 දිනැති අංක 2310/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල V පරිච්ඡේදයේ සඳහන් එකදු හෝ නුසුදුසුකමකින් යුක්ත නොවිය යුතු ය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

සියලු බඳවා ගැනීම් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට හා රජය විසින් පනවා ඇති චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව සිදු කෙරේ.

තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින්ගෙන් ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව එම විභාගයෙන් වැඩිම සමත් ලකුණු ලැබූවන්ගෙන් කුසලතා අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

08. විභාගය :

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විතය.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40 |
| 2. ඉංග්‍රීසි | පැය 02 | 100 | 40 |

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම අපේක්ෂකයකු ම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතු ය.

II. අපේක්ෂකයන් විසින් විභාගයට පෙනී සිටීමට ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

III. විෂය නිර්දේශය

විෂය අංක 01 - සාමාන්‍ය බුද්ධිය

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

විෂය අංක 02 - ඉංග්‍රීසි

I. අවබෝධය
මෙහි දී වචන 200ට නොවැඩි තෝරාගත් ලිඛිත ඛණ්ඩයක් කියවා අවබෝධ කර පිළිතුරු සැපයීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

II. ව්‍යාකරණ
කාලනාම, ක්‍රියා, ඍජු සහ වක්‍ර කථනය, කර්ම කාරක සහ කර්තෘ කාරක වාක්‍ය, ලිංග භේදය, නිපාත ආදී ක්ෂේත්‍රයන්හි සරල අවබෝධය පරීක්ෂා කෙරේ.

09. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ව්‍යුහගත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාග යේ ප්‍රතිඵල අනුව එම විභාගයෙන් වැඩිම සමත් ලකුණු ලැබූවන්ගෙන් කුසලතා අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකි. සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහා ම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් වත් ලබා නොග න්නා අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එක් එක් අපේක්ෂකයා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 45 | මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% |
| ජාතික වෘත්තීය කුසලතා 05 වන මට්ටම හෝ ඊට ඉහළ (NVQ 5 මට්ටම හෝ ඊට වැඩි) මට්ටමක පරිගණක භාවිතාව පිළිබඳ පුහුණුවක් | 30 | |
| ඉංග්‍රීසි භාෂාව තේරුම් ගැනීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන ආකල්ප හා පෞරුෂය සඳහා | 05 | |

පත් කරනු ලැබීම සඳහා තෝරා ගැනීමේ ක්‍රමය :

පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලබන්නේ ඉහත 03 යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව, විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල

එකතුව අනුව වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙලින් වේ.

විභාගයට පෙනී සිටීමට අයදුම්කර ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. විභාගයට අයදුම් කිරීමේ පිළිවෙළ :

I. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. විභාග ගාස්තුව රු. 1,200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

11. විභාග ප්‍රවේශ පත්‍රය :

I. මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කර ඇති හා අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර ලැබෙන ලෙස තම අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම්, එසේ පළකරනු ලබන දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. අයදුම්කරුවන් තමන්ගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම ද විභාග දෙපාර්තමේන්තුවට දැන්විය යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි වන අයුරින් ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුවන්ගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වේ.

III. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

IV. අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුට දන්වනු නොලැබේ.

12. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ. සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය.

එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුලත් කර ගනු නොලැබේ. විභාග ශාලාවට ඇතුලු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පැවැත්වෙන අතරතුර හෝ ඉන් පසුව කවර හෝ අවස්ථාවක දී වුව ද අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය. අයදුම්කරු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවත් හෝ කිසියම් අදාළ කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව එකී අයදුම්කරුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී හෝ සනාථ වුවහොත්, එය ම ඔහු/ ඇය වහාම සේවයෙන් පහ කරනු ලැබීමට හේතු වනු ඇත. තව ද මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා සපුරා නොමැති අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

14. මෙම බඳවා ගැනීමට අදාළවන සහ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති ඕනෑම කරුණක් පිළිබඳව තීරණයක් ගැනීම ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

ගීතාංජලී ආර්. රණවක,
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය.

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරී III ශ්‍රේණියේ බුද්ධිමය දේපළ නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2024

Open Competitive Examination For Recruitment to the Post of Associate Officers Grade III Intellectual Property Officer in the National Intellectual Property Office of Sri Lanka - 2024

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

01. නම :

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

02. ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරී :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ස්ත්‍රී [ ] පුරුෂ - 0
පුරුෂ [ ] ස්ත්‍රී - 1

3.2 උපන් දිනය :

වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

වර්ෂ : [ ][ ][ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

3.4 විවාහක/අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විවාහක : [ ] විවාහක - 1
අවිවාහක : [ ] අවිවාහක - 2

04. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

05. සම්බන්ධ කරගත හැකි දුරකතන අංක :

ජංගම : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ] ස්ථාවර : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

06. අධ්‍යාපන සුදුසුකම් :

6.1 උපාධිය පිළිබඳ විස්තරය :

| *උපාධිය* | *ආයතනය* | *සාමාර්ථය* | *විෂයයන්* | *වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

6.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය : වර්ෂය :————. මාසය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |

6.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය : වර්ෂය :————.මාසය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

07. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් ෘ

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

08. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
ගෙවූ මුදල :————.
ගෙවූ දිනය :————.
කුවිතාන්සි අංකය :————.

| කුවිතාන්සිය මෙහි අලවන්න |
|---|

09. *අයදුම්කරුගේ ප්‍රකාශය ෘ*

මෙම අයදුම්පතෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා බවත්, මුදල් ගෙවන ලදුපත අලවා ඇති බවත්, මා ඉදිරියේ දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

- අයදුම්කරුගේ අත්සන සහතික කිරීම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 10. VI ඡේදයේ සඳහන් පරිදි විය යුතුය.
- රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් පහත සඳහන් සහතිකය සමඟ සිය දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම දෙපාර්තමේන්තුවේ .................. ලෙස සේවය කරන .............................. මයා/මිය/මෙනෙවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් මුදා හැරීම කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

06-214